# බළන්ගොඩ නගර සභාව

## 2022-02-03 වන දිනැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.02.03**

**වේලාව - පෙ.ව. 11.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ජ්. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්. ජ්. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.00 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා පිළිගත් අතර, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන බව ප්‍රකාශ කරන ලදී.

**01. 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සම්මත කිරීම**

ගරු සභාපතිතුමන් විසින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතට අනුව බළන්ගොඩ නගර සභාවේ 2022 වර්ෂයට අදාල සංශෝධන ඇතුලත් කරමින් සකස් කළ අය වැය යෝජනාවලිය ගරු සභාවට ඉදිරිපත් කළ අතර, ගරු උප සභාපති එම්. ටී.එම්. රුමි මැතිතුමා විසින් එම අයවැය යෝජනාවලිය ස්ථිර කරන ලදී.

**පෙ.ව 11.05 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාව වෙත පැමිණෙන ලදී.**

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් 2022 වර්ෂයේ අයවැය කතාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**පෙ.ව 11.15 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාව වෙත පැමිණෙන ලදී.**

අයවැය කතාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතට අනුකූලව බළන්ගොඩ නගර සභාවේ 2022 වර්ෂයට අදාල අයවැය යෝජනාවලිය තමන් විසින් සභාගත කළ අතර, එම අයවැය යෝජනාවලියට සංශෝධන හෝ එකතු කිරීම් , සුළු වෙනස් කිරීම්, ප්‍රතික්ෂේප කිරීම් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස ද අයවැය සම්මත කිරීම හෝ නොකිරීම කෙසේ වෙතත් බලතල අනුව සම්මත වූ අයවැයක් සේ සලකා කටයුතු කළ හැකි බව ද සම්මත කර ගැනීම සඳහා බහුතර ඡන්දයක් අවශ්‍ය වන අතර, ඒ සඳහා සහයෝගය අපේක්ෂා කරන බව ද විවෘත ආරාධනයක් කරන බව ද පවසන ලදී.

එහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා, සභාපතිතුමන් විසින් ගෙනෙන ලද අයවැය යෝජනාවලිය කිසිදු සංශෝධනයක් නොමැතිව ස්ථිර කරන බව පැවසූ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා එය ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ලක්ෂ 06 ක් වෙන් වන බව අයවැය කතාවේ දී පැවසූ අතර, එසේ වෙන් වන්නේ මන්ත්‍රීවරයෙක්ට ද? කොට්ඨාසවලට ද? යන්න පිළිබඳව විමසීය.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන් සඳහා වෙන් වූ මුදලින් ලක්ෂ 06 සීමාවට යා හැකි බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ් විමලසිරි මැතිතුමා ගරු මන්ත්‍රීවරුන් සඳහා මිලියන 17 ක් යැයි පැවසූ බැවින් ඒ සම්බන්ධව පැහැදිලි කරන ලෙස පවසන ලදී.

එහි දී ගරු සභාපතිතුමා පැවසූවේ එක් මන්ත්‍රීවරයෙකුට මිලියනය බැගින් මන්ත්‍රීවරුන් 17 දෙනාට මිලියන 17ක් වෙන් කළ බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් අයවැය යෝජනාවලියෙහි ඇතුලත් ගාස්තු අයකිරීම් සම්බන්ධව උදාහරණ කිහිපයක් පෙන්වා දෙමින් එම අය කිරීම් සම්පූර්ණ කර ගත හැකිදැයි විමසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් අය කර ගැනීමට අපේක්ෂා කරන මුදල සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන බව පැවසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් විරෝධතාවයක් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ද විරෝධතා නොමැති නම් 2022 වර්ෂයේ අයවැය ඒකමතිකව සම්මත වූවා සේ සලකන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අයවැය සම්බන්ධව බෙදීමක් යෝජනා කළ අතර, එම යෝජනාව ස්ථිර නොවීය.

අනතුරුව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා, මෙම අයවැය උපකල්පනවලට සීමා වූ අයවැයක් බව ද රටේ නරකම කාලයේ සභාපති වශයෙන් නව සභාපතිතුමා පත් වූ අතර, පවතින මිල උච්චාවචනය ඉදිරි කටයුතුවල දී බලපාන බව ද මෙම අයවැයට තමන් විරුද්ධ බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් වසර දෙකක් අයවැය සම්මත කරගෙන කටයුතු කිරීමට හැකියාවක් තිබුණු අතර, වසර 02 ක් ජනතාවට සේවය කිරීමට නොහැකි වූ බව ද අයවැයෙහි ගැටලුවක් නොව දේශපාලන අරගලයක් පැවති බව ද කෙසේ වෙතත් ජනතාව වෙනුවෙන් සේවය කිරීමට පැමිණි බැවින් 2022 අයවැය සඳහා තම සහයෝගය ලබා දෙන බව ද ජනතාව වෙනුවෙන් වැඩ කරමින් බළන්ගොඩ නගර සභාව දිදුලන්න කටයුතු කිරීමට හා හිටපු ගරු සභාපතිතුමා සිටි කාලය මෙන් ඉදිරියටත් සහයෝගය ලබා දෙන බව ද පැවසීය.

එමෙන්ම කාන්තාවන් දේශපාලනයට යොමු වී ඇති අතර, සභාවේ දී කාන්තාවන්ට නොයෙකුත් ප්‍රශ්න ඇති වූ බව ද එම නිසා මෙම වසරේ දී කිසිදු ප්‍රශ්නයක් නොවී උපහාසයට අපහාසයට ලක් නොවන ලෙස කටයුතු කරගෙන යනු ඇතැයි තමන් අපේක්ෂා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවතින රජය පළාත් පාලන ආයතනවලට විශාල මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙන බව ද පක්ෂ විපක්ෂ බව නොබලා ලංකාවේ ග්‍රාම නිළධාරී කොට්ඨාස 14022 ක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර තිබෙන බව ද නගර සභාවේ කටයුතුවල දීත් පෙර නොවූ විරූ සංවර්ධනයන් කිරීමට හැකි බව ද ඒ සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ආධාර උපකාර කරන බව ද එම නිසා පක්ෂ භේදයකින් තොරව අපගේ නගරය සංවර්ධනය කිරීමට සහයෝගය ලබා දෙන ලෙස ද සියලුම දෙනාට සුබ අනාගතයක් වේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාගේ මංගල අයවැයට විරුද්ධ නොවන බව ද ප්‍රදේශයේ බදු ගෙවන ජනතාවට සේවය කිරීම අපගේ අරමුණ බව ද ආණ්ඩුවේ සහයෝගයත්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ සහයෝගයත් ගරු සභාපතිතුමාට ලැබෙන බව ද තම කොට්ඨාසයට ලක්ෂ 40 ක් ලැබුණු අතර, එයින් වැඩ 02ක් ආරම්භ කර බව ද ඒ සම්බන්ධව සතුටු බව ද පවසමින් ඉදිරි කටයුතු සඳහා සහයෝගය ලබා දෙන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා, 2022 වර්ෂයට අදාල අයවැය සම්මත කර ගැනීම සඳහා පක්ෂව හා විපක්ෂව බෙදීමක් යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 අයවැය සම්මත කර ගැනීම සඳහා පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් දොළොස් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද |

විපක්ෂව සභිකවරුන් එක් අයෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, පහත සඳහන් සභිකවරුන් සිව්දෙනා සභාවට නොපැමිණි ගරු සභිකයන් වේ.

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 4. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

ඒ අනුව 2022 වර්ෂයට අදාල අයවැය සඳහා පක්ෂව ඡන්ද 12 ක් ද, විපක්ෂව ඡන්ද 01 ක් ද වශයෙන් වැඩි ඡන්ද 11 කින් සභා සම්මත විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමන් විනිවිදභාවයෙන් යුක්තව අවංකව කටයුතු කරන බව ද එක්සත් ජාතික පක්ෂ ගරු මන්ත්‍රීවරුන් අයවැයට පක්ෂව ඡන්දය ලබා දීම සම්බන්ධව හදවතින්ම ස්තුතිවන්ත වන අතර අයවැයට විරුද්ධ වූ ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වන බව ද තම තමන්ගේ දේශපාලන න්‍යාය ක්‍රියාත්මක වීම පිළිබඳව තමන්ගේ කිසිදු ගැටලුවක් නොමැති බව ද තමන් ඡන්දවලට බයේ පැන යන කෙනෙක් නොවන බව ද පැවසීය.

අනතුරුව ගරු සභාපතිතුමා, වැදගත් ව්‍යාපෘතියක් මෙම අවස්ථාවේ ආරම්භ වන අතර, තමන්ට එම අවස්ථාවට සහභාගී වීමට සිදු වන බැවින් සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාමට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාට අවස්ථාව ලබා දෙන බව පවසා පෙ.ව. 11.27 ට පමණ සභා ගර්භයෙන් පිටව යන ලදී.

**02. තුරු උයනෙහි ඇති ලුණුමිදල්ල හා කායා ගස් දෙක වෙන්දේසි කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම**

ඉහත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, තුරු උයනෙහි පවතින ගස් තමන් විසින් සිට වූ අතර, එම ගස් කපා වෙන්දේසි කිරීමට තමන් විරුද්ධ නමුදු ව්‍යාපෘතියක් සිදු කිරීමේ දී මෙවැනි කටයුතු සිදු කිරීමට සිදු වන බව ද ඇතැම් අය ගස් කපා නිවස්වලට හෝ වෙන වෙන කටයුතුවලට යොදා ගන්නා නමුත් වෙන්දේසි කිරීමට යෝජනාවක් සභා අනුමැතියට යොමු කිරීම ඉතා කාලෝචිත හා විනිවිදභාවයෙන් යුතු බැවින් මෙම ගස් වෙන්දේසි කිරීමේ යෝජනාව තමන් ස්ථිර කළ බව ද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පසුගිය වසර දෙකෙහි වැඩ කිරීමට නොහැකි වූ බවට පැවසූ අතර, එසේ සිදු වූයේ බහුතරය නොතිබුණු නිසා බව ද හොඳම උදාහරණය වන්නේ අද දින ජනතා විමුක්ති පෙරමුණෙහි ගරු නාගරික මන්ත්‍රීතුමා විසින් බෙදීමක් යෝජනා කළ අවස්ථාවේ එය ස්ථිර කිරීමට කිසිවෙකු ඉදිරිපත් නොවීම බව ද අද දින ව්‍යාපෘති රැසකට අනුමැතිය ලැබුණු අතර, ඉදිරි මාස 06 ක කාලය තුළ බළන්ගොඩ විශාල පිබිදීමක් ඇති විය හැකි බව ද ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ජීවනෝපාය ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වන අතර, ග්‍රාම නිළධාරී වසම් 14022 ක ව්‍යාපෘති ක්‍රියාත්මක වන බව ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පොදු ජන එක්සත් පෙරමුණෙහි කැබිනට් මන්ත්‍රීවරු සිටින අතර, දෙපිරිසම එක්ව එකම ගමනක් යා හැකි බව ද වැඩිකල් නොගොස් ඡන්ද විමසීමකට යන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තුරු උයනෙහි ගස් නොකපා ව්‍යාපෘතිය කිරීමට හැකි බව ද එය ගෘහ නිර්මාණ ශිල්පියා දැන ගත යුතු බව ද ගස් කැපීම සම්බන්ධව තමන් විරුද්ධ බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව ගරු උප සභාපතිතුමා විසින් අද දින සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය කරමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.36 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ. වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.